**සති පාසල වැඩසටහන.**
**4 වන සතිය | 9 - ශ්‍රේණිය - විද්‍යාව**
**නිවිතිගල අධ්‍යාපන කලාප කාර්යාලය - සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**<u>මාතෘකාව - මානව රුධිර සංසරණ පද්ධතිය</u>**

<u>පාඩම - රුධිර ගණ හා රුධිර පාරවිලයනය</u>

*මෙම අධ්‍යයනය අවසානයේදී ඔබ,

- රුධිරයේ අඩංගු ප්‍රෝටීන සංඝටක අනුව A, B, AB, O ලෙස රුධිර ගණ හතරක් ඇති බව ප්‍රකාශ කරයි.
- රීසස් සාධකය පාදක කොට ගනිමින් ප්‍රධාන රුධිර ගණ ධන හා ඍණ ලෙස තවදුරටත් වර්ග කරයි.
- එක් අයකුගේ රුධිරය(දායකයා ) තව අයෙකුට(ප්‍රතිග්‍රාහකයා ) ශරීර ගත කිරීම රුධිර පාරවිලයනය බව ප්‍රකාශ කරයි.
- රුධිර පාරවිලයනයකදී නොගැලපෙන රුධිර ගණ මිශ්‍ර වීමෙන් ශ්ලේශනය වන බව ප්‍රකාශ කරයි.
- රුධිර පාරවිලයනයකදී රුධිර ගණ ගැලපීම සටහන් මගින් දක්වයි.
- රුධිර දායකයෙකු සතු සුදුසුකම් වගු ගත කරයි.
- රක්තපාතයකදී රුධිරය කැටි ගැසීම වැදගත් ආරක්ෂක ක්‍රියාවලියක් බව ප්‍රකාශ කරයි.

* පලමුව පෙළ පොතෙහි පිටු අංක 76 හා 77 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.නැවත නැවත කීප වතාවක්ම එසේ සිදු කරන්න. එමගින්,

1. රුධිර පාරවිලයනය යන්න නිර්වචනය කරන්න.
2. රුධිර දායකයා හා ප්‍රතිග්‍රාහකයා යන්න හඳුන්වන්න.
3. රුධිර ගණ හතර ලියන්න.
4. දායකයා,ප්‍රතිග්‍රාහකයා අතර රුධිර ගණ ගැලපීම සිදුවන ආකාරය 6.1 වගුව අනුව අධ්‍යයනය කරන්න(පසුව එය වෙනත් තැනක ඇඳ මතකයෙන් ගලපා පෙර වගුව අනුව සසඳා බලන්න.ඔබ නිවැරදි බව තහවුරු කරගන්න )
5. සර්ව දායකයා හා සර්ව ප්‍රතිග්‍රාහකයා යන්න වෙන වෙනම ලියා දක්වන්න.
6. 
   I. "රීසස් සාධකය ගැලපීම" යන්න 77 පිටුවෙහි ඇති කොටස අධ්‍යයනය කර $Rh^+$ හා $Rh^-$ යනු කුමක්දැයි වෙන වෙනම ලියන්න.
   II. 6.2 වගුව හා 6.8 රූපය ඇඳ /ලියා Rh සාධකය ගැන අධ්‍යයනය කරන්න.
7. රුධිර දායකයෙකු සතුවිය යුතු සුදුසුකම් ලැයිස්තුවක් සකස් කරන්න.(පිටු අංක 78,79 හි සඳහන් "අමතර දැනුමට" යන කොටසෙහි "රුධිර දායක ප්‍රකාශය හා වාර්තාව" යන කොටස අධ්‍යයනය කරන්න )
8. රුධිර ශ්ලේශනය යන්න හඳුන්වන්න.(පිටු අංක 79 අධ්‍යයනය කරන්න. )
9. තුවාලයක් සිදුවූ විට රුධිර වහනය වීම වැලක්වීම සිදුවන ආකාරය කෙටියෙන් ලියන්න.(පිටු අංක 79 පහල කොටස අධ්‍යයනය කරන්න )

** අමතර ක්‍රියාකාරකමක් ලෙස,

- පුවත්පත් හා සඟරා වලින් තොරතුරු රැස්කරන්න.
- හැකිනම් මෙම අන්තර්ජාල සබැඳිය ඔස්සේ රුධිර ගණ පිලිබඳ වැඩිදුර කියවන්න. https://www.nhs.uk/conditions/blood-groups/